# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2473/22 – 2026 ජනවාරි මස 29 වැනි බ්‍රහස්පතින්දා – 2026.01.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 03B, පරපේ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පරපේ ගමෙහි පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KE/RMB/2024/75 සහ 2024.11.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන කැබලි අක්ෂර ‘A’ වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0082 ක් පමණ වන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර **‘A’ – ඉඟුරුවත්තේකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0082**

උතුරට: ඇළ; නැගෙනහිරට: එම්. ඩී. සෝමාවතී සහ තවත් අය හිමිකම් කියන ඉඟුරුවත්තේකුඹුර සහ ඇළ; දකුණට සහ බටහිරට: ඇළ.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/6/2019/HW/217.
2025 දෙසැම්බර් මස 19 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”, 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

EOG 01 – 0283

1A – G 046197 – 13 (2026/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*